**ශ්‍රී ලංකා හොකී සම්මේලනය - 2025**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ ("සම්මේලනය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වන වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21.අ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන **කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට** අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1)වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි .

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සම්මේලනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සම්මේලනය කටයුතු කර ඇති බව,
- සම්මේලනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ජාත්‍යන්තර හොකී සම්මේලනයට සහ ආසියානු හොකී සම්මේලනයට ගෙවිය යුතු රු.226,271 ක සාමාජික ගාස්තුව, උපචිත වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2026 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව ගෙවිය යුතු රු.2,400,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | දැනටමත් රු. 200,000 ක් ගෙවා ඇති අතර ඉතිරි මුදල ඉක්මනින් ගෙවීමට කටයුතු කරමින් සිටි. | වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ ඇති වගකීම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්මේලනයේ සභාපතිවරයාට සහ ආසියානු හොකී සම්මේලනයට පිළිවෙලින් රු.961,788 ක් සහ රු.636,984 ක්වූ ගෙවිය යුතු මුදල් පිළිවෙලින් 2022 සහ 2024 වර්ෂවල සිට මෙම වාර්තාවේ දින දක්වාම පියවා නොතිබුණි. | සම්මේලනයේ විධායක කමිටුව සභාපතිවරයාගේ ගෙවීම් පියවීමට අනුමැතිය ලබා දී තිබේ. සම්මේලනයේ අරමුදල් නොමැතිකම හේතුවෙන් ක්‍රීඩා පිටිවලින් උපයන ආදායම භාවිතා කර පියවීමට කටයුතු යොදා ගෙන තිබුණි. | ගෙවිය යුතු මුදල් පියවීමට හෝ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2025 මැයි 21 දිනැති අංක 24/2437 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද, 2025 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග | | | |
| (i) III කොටසේ 9 (9) වගන්තිය | ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජීව දත්ත, තරඟවලට සහභාගී වූ වාර්තා, නියෝජනය කළ කණ්ඩායම් සහ කාර්යසාධන දත්ත සහිත තොරතුරු පද්ධතියක් සම්මේලනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ක්‍රීඩකයන් තෝරා ගැනීම, ශ්‍රේණිගත කිරීම් සහ වර්ගීකරණය කිරීම් ක්‍රියාවලීන්හිදී ඉහළ කුසලතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමට එවැනි දත්ත භාවිතාකර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව දත්ත ලබා ගැනීමට සහ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට පියවර ගැනීම සටහන් කරගන්නා ලදී. | සම්මේලනය විසින් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ii) III කොටසේ 9 (23) වගන්තිය | දිස්ත්‍රික් ක්‍රීඩා සංගමය විසින් තම බල ප්‍රදේශය තුළ අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය. වාර්ෂිකව අවම වශයෙන් ප්‍රාදේශීය තරඟ දෙකක් පැවැත්වීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම, ස්ථාවර ප්‍රාදේශීය ක්‍රීඩා සංචිත පවත්වාගෙන යාම සහ ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවල නිසි කළමනාකරණය සහ නියාමනය තහවුරු කිරීම ඊට ඇතුළත් වේ. කෙසේ වුවද, සම්මේලනය එසේ කිරීමට අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී ඒ සම්බන්දයෙන් කටයුතු කරනු ලැබේ | දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් නිතිපතා සම්මේලනය විසින් අධීක්ෂණය කර කළමනාකරණය කළ යුතුය. |
| (iii) III කොටසේ 10 (1) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද ජාතික ශූරතාවලි හතරක් සඳහා ශූරතාවලිය අවසන් වී දින 14ක් ඇතුළත වාර්ෂික ජාතික ශූරතාවලිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සම්මේලනය විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ජාතික ශූරතා තරඟාවලි පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) V කොටසේ 14 (19) වගන්තිය | අනුබද්ධ ආයතනවල වාර්තා පවත්වාගෙන ගොස් නොමැති අතර සම්මේලනය විසින් අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජයන් හෝ වෙනත් සංවිධාන සඳහා ලියාපදිංචි සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී ලියාපදිංචි සහතික නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලියාපදිංචි අනුබද්ධ සංගම් සම්බන්ධයෙන් වාර්තාවක් පවත්වා ගෙන ගොස් සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,280,740 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,406,407 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,874,333 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව කෘතිම ක්‍රීඩා පිටියේ ශුද්ධ ආදායම රු.8,400,916 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දැක්වේ.

| **විස්තරය** | **2025 දෙසැම්බර් 31 දිනට වටිනාකම** | **2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම** | **විචලනය** | |
|---|---|---|---|---|
| | | | **වාසිදායක/ (අවාසිදායක)** | **ප්‍රතිශතය** |
| | **රු.** | **රු.** | **රු.** | % |
| **ආදායම්** | | | | |
| ප්‍රදාන සහ පරිත්‍යාග | 16,790,834 | 23,537,554 | (6,746,720) | (29) |
| කෘතිම ක්‍රීඩා පිටි ආදායම් | 16,786,692 | 4,284,046 | 12,502,646 | 292 |
| ලියාපදිංචි ගාස්තු | 528,600 | 458,000 | 70,600 | 15 |
| වෙනත් ආදායම් | 18,375 | 65,389 | (47,014) | (72) |
| **වියදම්** | | | | |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් වියදම් | 17,911,507 | 21,037,769 | 3,126,262 | 15 |
| කෘතිම ක්‍රීඩා පිටි වියදම් | 6,608,666 | 2,506,935 | (4,101,731) | (164) |
| මූල්‍ය වියදම් | 58,165 | 4,200 | (53,965) | 1285 |
| අනෙකුත් වියදම් | 265,423 | 1,389,677 | 1,124,254 | 81 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය සිදු කෙරේ.

සමාලෝචිත වර්ෂය තුළ කෘතිම ක්‍රීඩා පිටියේ මෙහෙයුම් කටයුතු මගින් රු.10,178,026 ක ශුද්ධ ආදායමක් උපයා ගෙන තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අනුරූප වියදම්වල සියයට 164 ක වැඩිවීම සැලකිය යුතු ලෙස ඉක්මවා යමින් ආදායම සියයට 292 කින් වැඩිවීම මෙයට හේතු විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්මේලනයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සහ නිලවරණය පැවැත්වීමට කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් 2026 මැයි 21 දිනැති අංක 2489/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් 2026 මැයි 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම සම්මේලනයේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා නිසි බලධාරියා ලෙස පත් කර තිබුණි. | 2026 මැයි 19 වන දින සිට බලපැවැත්වෙන පරිදි තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා නිසි බලධාරියා ලෙස පත් කර තිබේ. | සම්මේලනයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නිලවරණය පැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීමට සම්මේලනය කඩිනමින් කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, දේශීය ක්‍රීඩා තරඟ හයක් (06) පැවැත්වීමට සහ ජාත්‍යන්තර තරඟ අටකට (08) සහභාගී වීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණේ දේශීය ක්‍රීඩා තරඟ හතරක් (04) සහ ජාත්‍යන්තර තරඟ දෙකක් (02) පමණි. | ප්‍රමාණවත් කාලයක් නොමැතිකම හේතුවෙන් දේශීය ක්‍රීඩා තරඟ හතරක් පමණක් පැවැත්විණි. 2025 දී නියමිත ජාත්‍යන්තර තරඟ නොපැවැත්වුණි. | සම්මේලනය විසින් සැලසුම් කළ පරිදි ක්‍රීඩා තරඟ පැවැත්වීමට කටයුතු කල යුතුය |